# කලවාන ප්‍රාදේශීය සභාව
# රත්නපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කලවාන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු. 10,128,902 ක වියදමකින් ඉදිකිරීම් නිමකල ආදාහනාගාරයේ වටිනාකම ප්‍රාග්ධනිත කර ගිණුම් වලට ගැලපීම් කර නොතිබුණි.

(ආ) එකතුව රු. 215,811 ක් වූ අක්‍රීය ගිණුම් ශේෂ 06 ක් සම්බන්ධයෙන් සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ වැය විෂයයන් 16 කට අදාලව වැය ලෙජරයේ වියදම සහ වියදම් ලේඛනය අතර රු. 9,371,058 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඈ) ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 21,135,893 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු. 19,328,377 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල වූ දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සඳහා වූ පොලිය රු. 155,845 ක ප්‍රමාණයක් පොලී ගිණුම මඟින් ආදායම් හා වියදම් ගිණුමට හර කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් යටතේ ගැලපීම් කර, එම වර්ෂයේ වියදමට ගැලපීම් කල යුතු රු. 884,014 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 19,440,573 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට වෙන් කර තිබූ ණයහිමි ශේෂ 30 ක එකතුව වූ රු. 4,196,983 ක අගයකට අදාල වවුචර්පත්, බිල්පත් වැනි තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,844,692 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,199,186 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 1,628 | 3,681 | 3,915 |
| (ii.) | බදු කුලී | - | - | - |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 900 | 524 | 375 |
| (iv.) | වෙනත් ආදායම් | 12,509 | 17,025 | 2,514 |

2.2.2 වෙනත් ආදායම්

1987 ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ ඒ ඒ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති බලතල අනුව වාර්ෂික ආදායමෙන් සියයට 1 ක ගාස්තුවක් අය කල හැකි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝටල්/ ආපන ශාලා/ නවාතැන් පලවල් හඳුනා ගෙන අදාල රෙගුලාසිය ප්‍රකාරව ආදායම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 මාර්ග තලනය කුලියට දීම

(අ) මාර්ග තලන යන්ත්‍රය කුළී පදනම මත ලබා දීම සඳහා 2010 ඔක්තෝබර් මස රාජ්‍ය සංවර්ධන නිර්මාණ සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර, 2009 දෙසැම්බර් මස සිට 2011 නොවැම්බර් මස දක්වා මාස 21 ක් සඳහා රු. 1,864,007 ක් අය වීමට තිබුණි. එකී මුදල් අයකර ගැනීම සඳහා විගණිත දිනය වූ 2012 දෙසැම්බර් 14 දින දක්වා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් මස සිට ගනේගොඩ කන්ස්ට්‍රක්ෂන් නම් පෞද්ගලික ආයතනයකට මාර්ග තලනය කුලියට දී තිබුණ ද සමාලෝචිත වර්ෂ අවසානයට රු. 522,494 ක් අයවීමට තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 264,721 |
| (ii.) | මුද්දර ගාස්තු | 2,500,000 |

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා නොමැතිව රු. 21,360 ක් වියදම් දරා තිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු
----------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආයතනයට ඍජු ලෙස සම්බන්ධ රාජකාරිද යන්න තහවුරු කර ගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සභාපතිවරයාට සංයුක්ත දීමනා වශයෙන් රු. 24,000 ක් ගෙවා තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 08 දිනැති බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනය මගින් ඉදිරිපත් කරන ලද ලිපිය මගින් බිල්පත් 11 ක් යටතේ රු. 707,441 ක් අයවීමට පවතින බවට කරන ලද දැනුම් දීමට අනුව එම මුදල ගෙවීම් කර තිබූ නමුත් සපයන ලද හියුම් පයිප්ප තොග ලේඛනගත කිරීම් පිළිබඳ විස්තර හෝ බිල්පත් පිළිබඳව තහවුරු විගණනයට ඉදිරිපත් නොකෙරින.

2.5 මෙහෙයුම් අකර්යක්ෂමතා
--------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව යම් කාර්යයක් සඳහා ලබා ගත් අත්තිකාරම් එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත් එකතුව රු. 100,000 ක් වූ අත්තිකාරම් 02 ක වටිනාකම 2012 දෙසැම්බර් 31 දින වන විට අත්තිකාරම ලබා ගෙන වසර 01 මාස 06 ක කාලයක් ගතවී තිබූ නමුත් පියවීම් කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) සභාවේ පුරප්පාඩු වූ ආදායම් පරිපාලක තනතුරු සඳහා 2011 නොවැම්බර් 17 දින සිට සතියකට දින 02 ක් සේවය කිරීමේ පදනම මත පළාත් පාලන කොමසාරිස් විසින් ආදායම් පරිපාලකවරයෙකු අනුයුක්ත කර ඇති නමුත්, එකී අනුයුක්ත දිනයේ සිට 2012 නොවැම්බර් මස 10 වන දිනට රු. 128,628 ක් පමණක් ආදායම් එකතු කර ප්‍රේෂණය කර තිබූ අතර, එම වටිනාකම අයවැයගත ප්‍රමාණයත් සමඟ ගත් කල 0.3 ත් 11.8 ත් අතර, ඉතා අඩු ප්‍රතිශතයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 423,242 ක් වූ චෙක්පත් 55 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) එකතුව රු. 2,710,120 ක් වූ ඉකුත් තැන්පතු ප්‍රමාණයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 හා 572 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ හා 2010 නොවැම්බර් 16 දිනැති අංක 01/2010 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව සභාව විසින් 2012 දෙසැම්බර් 14 දින වන විට අනියම්, කොන්ත්‍රාත් පදනම් මත සේවකයින් 07 දෙනෙකු බඳවා ගෙන 2011 හා 2012 වර්ෂ තුලදී රු. 1,271,263 ක් වැටුප් ගෙවා තිබුණි.

3. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය